අප්‍රේල් 04, 2023 දින පැවැත්වුණු, සතිපතා අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී, කැබිනට් ප්‍රකාශක, ප්‍රවාහන මහාමාර්ග සහ ජනමාධ්‍ය අමාත්‍ය බන්දුල ගුණවර්ධන විසින්, උපයන විට ගෙවන (PAYE) බද්ද සම්බන්ධයෙන් කළ සඳහන් කිරීම්, මාධ්‍ය වාර්තා තුළ පළ වී තිබිණි.
මෙහිදී, අමාත්‍ය බන්දුල ගුණවර්ධන විසින්, "උපයන විට ගෙවන බද්ද අසාධාරණ ද" යනුවෙන් සඳහන් කළ තොරතුරු, දිනමිණ, ඩේලිනිව්ස් සහ ඩේලිමිරර් පුවත්පත් තුළ දැක්වී තිබිණි. කෙසේ නමුත්, එම තොරතුරු වල තිබූ ගැටළුකාරී තැන්, අපි මෙසේ ලැයිස්තුගත කරමු.
* නිදසුනක් ලෙසින් දක්වමින් අමාත්‍යවරයා පවසන්නේ, රුපියල් 200,000 ක වැටුපක් ලබාගන්නා අයෙකු ගෙවිය යුතු බද්ද රුපියල් 7,500 ක් බවයි. කෙසේ නමුත්, මෙම ගණනය කිරීම සාවද්‍ය වන අතර, රුපියල් 200,000 ක වැටුපක් ලබාගන්නෙකු ගෙවිය යුතු 'උපයන විට ගෙවන බද්ද' වන්නේ රුපියල් 10,500 කි. (https://publicfinance.lk/.../income-tax-calculator...)
* ඉන්ධන මිල අඩු කිරීම ඔස්සේ පාරිභෝගිකයාට ඉතිරියක් වන බව අමාත්‍යවරයා පැවසීමේදී, ඔහු උපකල්පනයන් කිහිපයක් සිදු කරයි. එනම්, 1) පුද්ගලයෙකු පරිභෝජනය කරන්නේ ඔක්ටේන් 92 ඉන්ධන පමණක් බව, සහ 2) පුද්ගලයෙකු පරිභෝජනය කරන්නේ එවකට තිබූ සතිපතා ඉන්ධන කෝටාව (සතියට ලීටර් 20 ක්) පමණක් බවයි. එම උපකල්පනයන් සෑම පුද්ගලයෙකුටම අදාළ නොවන බව අමතක කර දැමුවද, මෙම ඉන්ධන මිල පහළ දැමීම පාරිභෝගිකයාට ඉතිරියක් ලෙසින් සැලකිය හැකි නොවන්නේ, ඉන්ධන මිල සූත්‍රය අනුව, මිල පහළ දැමීමෙන් පසුවද සංස්ථාවට ලීටරයකින් රුපියල් 41 ක ලාභයක් ඇති බැවිනි.
* කෙසේ වුවත්, රජය පිරිවැය එලදායී ඉන්ධන මිල සූත්‍රයක් ඔස්සේ ඉන්ධන ලබාදෙන්නේ නම්, ඔක්ටේන් 92 ලීටරයක මිල රුපියල් 299 දක්වා පහත හෙළිය හැකි වේ. නමුත් තවමත් ඉන්ධන ලීටරයක මිල රුපියල් 340 ක් වේ (මාර්තු 31, 2023 මිල ගණන් අනුව). ඒ අනුව, අමාත්‍යවරයා පවසන ලෙසට, රජය ඉන්ධන ලීටරයක් රුපියල් 340 ක් දක්වා රුපියල් 60 කින් ඉන්ධන මිල පහත හෙළීම, පාරිභෝගිකයාට ලබා දෙන සහන මිලක් ලෙසින් සැලකිය හැකි නොවේ.
මේ අනුව බලන විට,
1) මාධ්‍ය හමුවකදී ජනතාවට වගකිව යුතු තනතුරු දරන්නෙකු විසින් පවසන කරුණු වුවත්, එලෙසින්ම මාධ්‍ය විසින් පළ කිරීම යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද?
2) එවැනි වගකිව යුතු තනතුරක සිටින්නෙකු පවසන තොරතුරු වල නිරවද්‍ය භාවය මූලිකව හෝ පිරික්සා බලා, එම තොරතුරු වල ගැටළුකාරී තැන් තිබේ නම් ඒ පිළිබඳව ද පාඨකයාට ඉදිරිපත් කිරීම, වගකීම් සහගත මාධ්‍යකරණය නොවන්නේ ද?
මූලාශ්‍ර:
https://dashboards.publicfinance.lk/fuel-price-tracker/
https://publicfinance.lk/.../income-tax-calculator...
**https://www.facebook.com/DepartmentOfGovernmentInformation/videos/219713313980711**

# උපයන විට ගෙවීමේ බද්ද:
# "බිල්ලා" කවුද?



## Masses given wrong image on PAYE Tax - Minister

SANDHYA KARUNARATNE

Transport, Highways and Mass Media Minister Dr. Bandula Gunawardena yesterday said that some people have portrayed a wrong image citing

| | | |
|---|---|---|
| Employee earning Rs. 200,000 pays PAYE Tax | | Rs. 7,500 |
| Gas price reduction | Rs. 1,005 | |
| Benefit from petrol reduction | Rs. 4,800 | |
| | Rs. 5,805 | Rs. (5,805) |
| Total tax payable now | | Rs.1,695 |

Daily News 2023-04-05

Employee who draws Rs. 200,000 per month now has to pay only Rs.1,700/- as tax: Bandula

DailyMirror 2023-04-05

## ඇතැම් අය උපයන විට බද්ද ගැන බොරු බිල්ලන් මවනවා

| | | |
|---|---|---|
| ලක්ෂ 2ක වැටුපක් ගන්න අයෙක් ගෙවිය යුතු බද්ද රු. | | 7500 |
| ගෑස් අඩුවීම - රු. | 1005 | |
| පෙට්‍රල් වාසිය - රු. | 4800 | |
| | 5805 | (5805) |
| බදු වශයෙන් ගෙවිය යුතු මුදල රු. | | 1695 |

දිනමිණ 2023-04-05